ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ඇබෑර්තු

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුව පවතින ආරක්ෂක නිලධාරී තනතුර සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත් අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද සමඟ **2026.08.17** වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ **"පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ"** යන ලිපිනයට **<u>ලියාපදිංචි තැපෑලෙන් පමණක්</u>** එවිය යුතු ය. තමන් අයදුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතු ය. (මෙම තොරතුරු www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබාගත හැකි ය).

**ආරක්ෂක නිලධාරී තනතුර (පුරප්පාඩු සංඛ්‍යාව - 03)**

1. **<u>වැටුප් පරිමාණය:</u>**
   2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 47,240-9x540/10x590/3x680- 60,040 /- වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාල අවම ආරම්භක දළ මාසික වැටුප රු. 87,000.00ක් පමණ වේ).

2. **<u>අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද:</u>**
   සිංහල හෝ දෙමළ භාෂාවට සම්මාන සාමාර්ථයක් ද, ගණිතය හා ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයන්ද සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වී තිබීම

   **සහ**

   වසර 10 කට නොඅඩු සම්මානනීය සේවාවක් සහිත යුද්ධ හමුදාවේ සැරයන් හෝ ඊට නොඅඩු තත්ත්වයේ තනතුරක් දරන ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවක (නිත්‍ය) සාමාජිකයෙකු හෝ වසර 10 කට නොඅඩු සම්මානනීය සේවාවක් සහිත සැරයන් හෝ ඊට නොඅඩු තත්ත්වයේ තනතුරක් දරන ශ්‍රී ලංකා පොලිසියේ සාමාජිකයෙකු වීම

   **හෝ**

   අයදුම්පත් භාරගන්නා අවසන් දින වන විට පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ 'ඒ' හෝ 'බී' වැටුප් කාණ්ඩවලට අයත් තනතුරක වසර 10ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

3. **<u>වයස් සීමාව</u> :**
   අයදුම්පත් භාරගැනීම අවසන් වන දිනට වයස අවුරුදු 30 ට නො අඩු හා අවුරුදු 50 ට නොවැඩි විය යුතුය. (පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

4. **<u>බඳවා ගැනීමේ ක්‍රමය</u> :**
   ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

   (අ) **ලිඛිත පරීක්ෂණය:**
   භාෂා හැකියාව සහ සාමාන්‍ය දැනීම පරීක්ෂා කර බලනු ලබන අතර, ලිඛිත පරීක්ෂණයේදී ලබා ගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියයකි (100).

   (ආ) **සම්මුඛ පරීක්ෂණය**
   ලිඛිත පරීක්ෂණය සමත් වන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණයේදී පහත සඳහන් නිර්ණායක අනුව ලකුණු ලබා දෙනු ලැබේ. එහිදී ලබා ගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියයකි (100).

| | නිර්ණායක |
|---|---|
| 01 | අමතර අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් |
| 02 | විෂය දැනුම |
| 03 | පළපුරුද්ද |
| 04 | පෞරුෂත්වය හා සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා |

**5. සේවා නියමයන් හා කොන්දේසි**

(i) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. තෝරාගනු ලබන අයදුම්කරුවන් මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවය ස්ථිර කරනු ලැබූ පුද්ගලයෙක් තෝරා ගනු ලැබුවහොත්, ඔහු/ඇය වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ඇත.

(ii) පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පාර්ලිමේන්තුවේ මහ ලේකම්ට බලය ඇත.

(iii) තෝරාගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

(iv) තෝරාගනු ලබන අයදුම්කරුවන් රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයකට අනුව වැන්දඹු හා අනත්දරු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට තම වැටුපෙන් දායක මුදල් ගෙවිය යුතු ය.

(v) තෝරාගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතු ය.

(vi) තෝරාගනු ලබන අයදුම්කරුවන් පත් කරනු ලැබීමට පෙර ඔවුන් පිළිබඳව ආරක්ෂක නිෂ්කාශන වාර්තා ලබා ගනු ඇත.

**6.** අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් **(මුල් පිටපත් නොවේ)** සිය අයදුම්පත්වලට අමුණා එවිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

(අ) උප්පැන්න සහතිකය
(ආ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික
(ඇ) වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතික
(ඈ) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික

**7.** සන්නද්ධ හමුදාවල සහ ශ්‍රී ලංකා පොලීසියේ සේවය කරන අයදුම්කරුවන්, සිය අයදුම්පත් අදාළ සන්නද්ධ හමුදාධිපති හෝ පොලිස්පති හරහා එවිය යුතු ය.

**8.** තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුරු සඳහා නුසුදුසුකමක් වනු ඇත.

**9.** අයදුම්පත්‍රයෙහි සඳහන් වන කවර හෝ කරුණක් වැරදි යැයි යමකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

**10.** අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් හරහා යොමු කරනු නොලබන අයදුම්පත් (දැනට රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ සේවය කරනු ලබන්නේ නම්) ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ද ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**11.** සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම්, එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

හංස අබේරත්න
වැ.බ. පාර්ලිමේන්තුවේ මහ ලේකම්

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.
2026 ජුලි මස ................